අද
අඟහරුවාදා
2014-10-14

# මාලඹේ එක සිසුවෙකුට හෝ සායනික පුහුණුව දුන්නොත් සෞඛ්‍ය සේවය අකර්මණ්‍ය කරනවා



## – සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

■ අමිත් මධුරංග/ ඡායාරූප - ඉසුරු පෙරේරා

මාලඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ ඉගෙනගන්නා එක් සිසුවෙකුට හෝ රජයේ රෝහල්වල සායනික පුහුණුව ලබාදුනහොත් එතැන් සිට සෞඛ්‍ය ක්ෂේත්‍රය අකර්මණ්‍ය කරමින් වැඩවර්ජන දියත්කරන බව සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඊයේ (13දා) අනතුරු ඇඟවීය.

P 04





මහජන මුදල් යොදාගෙන පෞද්ගලික උපාධි ආයතන නඩත්තු කිරීමට ඉඩ ලබාදිය නොහැකි බවත්, ඉදිරියේදී මෙම ගැටලුව හේතුවෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අර්බුද පිට අර්බුද හටගනු ඇති බවත්, එම සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර මහතා පවසා සිටියේය.

'මාලඹේ වෛද්‍ය උපාධි කඩය වසාදමනු' මැයෙන් කොළඹ ජාතික රෝහල අසලින් ආරම්භවී සෞඛ්‍ය අමාත්‍යාංශය දක්වා පැමිණි විරෝධතා පාගමන අවසානයේදී හෙතෙම මෙම අදහස් දැක්විය.

මාලඹේ වෛද්‍ය විද්‍යාලයේ සිසුන්ට රජයේ රෝහල්වල සායනික පුහුණුව ලබාදීමට අවසර දෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සුදර්මා කරුණාරත්න මහත්මිය නිකුත් කළ ලිපියට විරෝධය පළකිරීම සඳහා ඊයේ (13දා) දහවල් මෙම උද්ඝෝෂණය පැවැත්විණි.

මේ සඳහා වෛද්‍යවරුන් සහ වෛද්‍ය සිසුන් පිරිසක් එක්ව සිටි අතර, එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ජයන්ත බණ්ඩාර මහතා,

"ලංකාවේ ඉන්න 15,000 ක් වන සමස්ත වෛද්‍යවරුන් නියෝජනය කරමිනුයි අපි මෙම උද්ඝෝෂණය පවත්වන්නේ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව හැර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම සහ සෞඛ්‍ය අමාත්‍යාංශය මාලඹේ වෛද්‍ය විද්‍යාලයට අනුමැතිය දී තිබෙනවා. සෞඛ්‍ය ලේකම් මොන පදනමක ඉඳලද මේ පෞද්ගලික ආයතනයකට මහජන මුදල් ලබාදෙන්නෙ? කාගේවත් බූදලයක් විදියට මහජන මුදල් එහෙම ලබාදෙන්න බැහැ. මේ තීරණය හකුළාගෙන මාලඹේ වෛද්‍ය විද්‍යාලය ඉවත් කරගන්නා තුරු වෛද්‍යවරුන් ලෙස අපි සටන් කරනවා" යැයි පවසා සිටියේය.

අනතුරුව සායනික පුහුණුවට විරෝධය පළකරමින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත සංදේශයක් බාරදීමද සිදුවිය.